# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2141/25 - 2019 සැප්තැම්බර් මස 18 වැනි බදාදා - 2019.09.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනත

2 වැනි වගන්තිය යටතේ නියමය

ජනාධිපතිවරයාගේ ධූර කාලය 2020 ජනවාරි මස අටවැනි දින දී ඉකුත්වන හෙයින් ද,

ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම සඳහා ඡන්ද විමසීම, ධූරය දරන ජනාධිපතිවරයාගේ ධූර කාලය ඉකුත් වීමට පෙර මාසයකට අඩු නොවන සහ මාස දෙකකට වැඩි නොවන කාලසීමාවක් තුළ පැවැත්විය යුතු යැයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 31 වැනි ව්‍යවස්ථාවේ (3) වැනි අනුව්‍යවස්ථාවෙන් නියමිතව ඇති හෙයින් ද,

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ආ වැනි ව්‍යවස්ථාව සමඟ කියැවෙන, 1981 අංක 15 දරන, ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ 2 වැනි වගන්තියෙන් මැතිවරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර :

(I) 2019 ඔක්තෝබර් මස 07 වැනි දිනය ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම සඳහා අපේක්ෂකයන්ගේ නාමයෝජනා කිරීමේ දිනය ලෙස ද ;

(II) මැතිවරණ මහලේකම් කාර්යාලය, සරණ මාවත, රාජගිරිය, එම තෝරාපත් කිරීම සඳහා අපේක්ෂකයන්ගේ නාමයෝජනා කිරීමේ ස්ථානය ලෙස ද ;

(III) 2019 නොවැම්බර් මස 16 වැනි දිනය එම තෝරාපත් කිරීම සඳහා ඡන්ද විමසීම පවත්වන දිනය ලෙස ද

මේ නියමය මගින් නියම කරමු.

| | | |
|---|---|---|
| මහින්ද දේශප්‍රිය, | එන්. ජේ. අබේසේකර, | එස්. රත්නජීවන් එච්. හූල්, |
| සභාපති, | සාමාජික, | සාමාජික, |
| මැතිවරණ කොමිෂන් සභාව. | මැතිවරණ කොමිෂන් සභාව. | මැතිවරණ කොමිෂන් සභාව. |

2019 සැප්තැම්බර් මස 18 වැනි දින,
මැතිවරණ මහලේකම් කාර්යාලය,
රාජගිරිය.


1A - G 30914 — 637 (2019/09)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*